**ශීර්ෂය - 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**------**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 22 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 අයවැය යෝජනා යටතේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි ආනයනය කිරීමේදී බදුවලින් නිදහස් කර තිබුණද, සැපයුම්කාර සමාගම ඒ වනවිටත් නිෂ්පාදන බදු ගෙවා ආනයනය කර තිබූ යතුරුපැදි 2000 ක් ලබාගෙන බෙදාදීමට කටයුතු කර තිබුණි. එම යතුරුපැදි 2000 ට අදාළ | සංශෝධිත විචලතාවන්ට හේතු පැහැදිලිව මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති අතර ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී හඳුනා නොගත් ප්‍රමුඛ වියදම් දැරීම් සඳහා ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබා ගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය |

| | | | |
|---|---|---|---|
| | රු. 109,612,000 ක් වූ නිෂ්පාදන බදු මුදල්වලින් රු. 12,505,974 ක මුදලක් වර්ෂ 05 කට පසු 2020 දෙසැම්බර් 31 දින කල්බදු වාහන සඳහා ලබාගත් ණය මුදල් ආපසු ගෙවීම වැය විෂයය යටතේ දරා තිබුණි. ඉතිරි බදු මුදල් ඉදිරියේදී ගෙවීමට සිදුවිය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. | | සඳහාත් ආදායම් පුරෝකතනය හා වාර්තා තබා ගැනීම විධිමත් කල යුතුවීම. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී වැය විෂයයන් 08 ක විචලතාවය සියයට 88 ක අඩුවීමේ සිට සියයට 64 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |

## 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් චෙක්පත් නිකුත් කිරීමේදී ඒවායේ දිනයන් නැවත නැවත දීර්ඝ කරමින් දිගුකාලයක් බැංකු සැසඳුම්වල පවත්වා ගෙන ගොස් තිබුණි. | මෙම සියළු චෙක්පත් රාජ්‍ය ආයතන, අධිකාරී හා වෘත්තිය සංගම් සඳහා සඳහා නිකුත් කළ චෙක්පත්වේ. COVID – 19 වසංගතය හේතුවෙන් චෙක්පත් දින දීර්ඝ කිරීමේ ලේඛන නිසි ලෙස යාවත්කාලීන නොවූ අතර මින් ඉදිරියට මෙම ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදුනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු ගිණුම් මෙහෙයවීම සිදු කළ යුතුවීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල චෙක්පත් තුනක මාස 06 ක කාලය ඉක්මවා තිබියදී මු.රෙ 396 (ඇ) අනුව කටයුතු නොකරමින් දින දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. | | -එම- |

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 පෙබරවාරි 26 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම, අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම අවසන් කළයුතු බව දක්වා ඇතත් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය අදාලව සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයට අදාලව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව 2021 ජූනි 24 විගණිත දින වන විටත් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් යම් ප්‍රමාදයක් ඇති වුවද මේ වනවිට ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරීමට හා වෙන්දේසි කිරීමට අදාළ කටයුතු අවසන් අදියරේ පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුවීම. |
| (ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කල යුතු වුවත් විගණනයට ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) වර්ෂය තුළ අත්තිකාරම් අයකර ගැනීම රු.14,383,960 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු.5,320,469 ක් වීමෙන් රු.9,063,491 කින් මුදල් ගලාඒම අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ii) | අත්තිකාරම් ගෙවීම් රු.12,826,576 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු. 6,394,558 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 6,432,018 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | -එම-. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂයක් වේ නම් එම ශේෂය භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ද එම ශේෂයම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ ද පෙන්විය යුතු වුවද , 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය වූ රු.347,871 ක වටිනාකම එසේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවා ඇති බැවින් එදිනට පසු නිරවුල් කලයුතු ජංගම වගකීමක් ද දෙපාර්තමේන්තුව සතුව නොපවතී. | -එම- |

## 2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 පෙබරවාරි 16 දින මියගොස් තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.102,497 වූ ණය ශේෂය වසර 20 කට අධික කාල සීමාවක සිට දෙපාර්තමේන්තුවේ පොත්වල පවතී. මේ සම්බන්ධව පසුගිය විගණන විමසුම් තුළින් දිගින් දිගටම පෙන්වා දී තිබුණද මෙතෙක් එම ණය අයකරගැනීමට හෝ ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු 2014 පෙබරවාරි 26 දිනෙන් පසු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2000 සැප්තැම්බර් 18 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 101,561.30 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොමැති බව ගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ඔහුගේ සම්බන්ධිත පාර්ශවයන්ට විරුද්ධව නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | -එම- |
| (ඇ) | 2015 සැප්තැම්බර් 23 දින සිට රාජකාරී කටයුතු සඳහා වාර්තා නොකිරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් 13 සේවය අතහැරයාමේ නියෝගයක් නිකුත් කර තිබූ නිලධාරියෙකු විසින් 2017 අප්‍රේල් 26 දින ඉදිරිපත් කල අභියාචනාව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිෂ්ප්‍රභා කරමින් ඒ බව 2018 අගෝස්තු 17 දින අයවැය අධ්‍යක්ෂක ජනරාල්ට දන්වා යවා තිබුණි. එම නිලධාරියාගේ 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයවිය යුතු රු. 150,119 ක් වූ ණය ශේෂය අයකරගැනීමට අප්‍රමාදව කටයුතු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. | නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇති අතර, ඒ සඳහා පිළිතුරු නොලදහොත් නඩු පැවරීමට අදහස් කරමි. | -එම- |
| (ඈ) | 2020 අගොස්තු 28 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 144,150 ක ආපදා ණය ශේෂය 2020 දෙසැම්බර් 31 වන තෙක් අයකරගැනීමට නොහැකි වී ඇත්තේ 2021 පෙබරවාරි 10 වනවිටත් ඔහුගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාළ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවීමට ප්‍රමාද වීම හේතුවෙන් බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය හේතුවෙන්, සතියට දින කිහිපයක් පමණක් සේවයට කැඳවීම සිදුවූ බැවින් විශ්‍රාම වැටුප් ලිපිගොනුව සැකසීමට හා යැවීමට යම් ප්‍රමාදයක් ඇති විය. | -එම- |

## 2.5 තැන්පත් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දින වනවිට රු. 10,867,222 ක මුදලක් තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීමට තාවකාලිකව රඳවාගන්නා ලද පොදු තැන්පතු ගිණුම තුළ රඳවා ගෙන තිබුණි. මෙම තැන්පතු ක්ෂේත්‍ර නිලධාරීන් එම තනතුරුවලින් ඉවත්වීමේදී දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ශේෂ වටිනාකම් වූ අතර එම මුදල් ලද විගස අදාළ කල්බදු සමාගමට ගෙවා බැරකම් නිරවුල් කිරීම තුළින් ඊට අදාළ කල්බදු පොළිය අඩු කරගැනීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපසු ගෙවීමට ඇති අවස්ථා සම්බන්ධව නිවැරදි තක්සේරුවකින් අනතුරුව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතු බැවින් මෙලෙස රඳවාගෙන ඇත. | රජයට උපරිම ආර්ථික වාසියක් අත්වන අයුරින් කටයුතු කිරීමට අවධානය යොමුකළ යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 31. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

### 3.1.1 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 අංක 06 දරණ විසර්ජන පනතේ 06 වන වගන්තිය ප්‍රකාරව 240-2-2 ව්‍යාපෘතිය යටතේ වෙන්කර ඇති පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ අදාළ ආයතන වෙත හදිසි හා අනපේක්ෂිත අවශ්‍යතාවක් ඇතිවූ විට ප්‍රතිපාදන වෙන්කිරීමත්, එසේ වෙන්කරන ලද ප්‍රතිපාදනවල කාර්යක්ෂමතාවය තහවුරු කිරීමත්, කාර්යක්ෂමතාවය අනුව | | |

ප්‍රතිපාදන නැවත නැවතත් වෙන්කිරීමත් හෝ මාරුකිරීමත් අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එසේ වුවත්, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ දරන ලද මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා නිකුත් කරන ලද අතිරේක ප්‍රතිපාදනවල උපයෝජනය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන වියදම් සඳහා බලය ලබාදුන් මුළු ප්‍රතිපාදන භාවිතා නොකරමින් රු. මිලියන 11,997.86 ක් එනම් සියයට 38 ක ඉතිරිවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය අංකය | බලය ලබාදෙන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදන | වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු ප්‍රතිපාදන | ඉතිරිවීම් |
|---|---|---|---|
| ----------- | ----------- | --------------- | ------ |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2-2-0-1702-11 | 31,740.93 | 19,743.07 | 11,997.86 |

හදිසි හා අනපේක්ෂිත වියදම් අවශ්‍යතා ඇතිවූ විට ප්‍රතිපාදන වෙන් කරන අතර තවද එම ප්‍රතිපාදන වියදම් කිරීම හා ඉතිරිවීම සම්බන්ධ වගකීම අදාළ ආයතන වෙත පැවරේ.

නිවැරදි තක්සේරුවකින් තොරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන ඇතුළත් කිරීම හේතුවෙන් අයවැය හිඟය ඉහළ යාම මෙන්ම ඒවා මූල්‍යනය සඳහා තවදුරටත් වැයදැරීම පාලනය කරගත යුතුවීම.

(ii) මු.රෙ. 75 අනුව අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් මාරුකිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුත්තේ ඉතිරිවීම් අඩුකළ පසු ශේෂය වුවද 2020 වර්ෂය තුළ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පරිපූරක ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදිත, ප්‍රතිපාදන මුළුමනින්ම වියදම් නොකර රු.14,302,830,684 ක් ඉතිරිවී තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය.

ඒ සම්බන්ධයෙන් මු.රෙ. 75 අදාල කරගැනීමේ පූර්ණ වගකීම අදාළ ආයතනය සතුවේ.

-එම-

(ආ) පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ දරන ලද මූලධන වියදම් සම්බන්ධයෙන් විගණනයේදී පහත කරුණු අනාවරණය විය.

(i) මූලධන වියදම් සඳහා බලය ලබාදුන් මුළු ප්‍රතිපාදන හා වර්ෂය තුළ නිකුත් කරන ලද ප්‍රතිපාදන අතර රු. 3,199,137,385 ක් එනම් සියයට 26 ක ඉතිරිවීමක් නිරීක්ෂණය විය. ඒ තුළ ප්‍රතිපාදිත මුදලින් වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම නිකුත් නොකර තිබූ වටිනාකමේ එකතුව රු.100,000,000 ක් වී

එම ප්‍රතිපාදන වියදම් කිරීම හා ඉතිරිවීම සම්බන්ධ වගකීම අදාළ ආයතන වෙත පැවරේ.

-එම-

තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය අංකය | බලය ලබාදෙන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදන | වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු ප්‍රතිපාදන | ඉතිරිවීම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2503-14 | 50,000,000 | - | 50,000,000 |
| 2503-15 | 19,000,000 | - | 19,000,000 |
| 2503-16 | 1,000,000 | - | 1,000,000 |
| 2503-17 | 30,000,000 | - | 30,000,000 |
| 2503-11 | 12,404,627,000 | 9,305,488,615 | 3,099,138,385 |
| මුළු\ එකතුව | | | 3,199,137,385 |

(ii) මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණද, එම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් වියදම් නොකර ඉතිරි වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු. 2,415,269,093 ක් වී තිබුණි. -එම-

### 3.1.2 රජයේ අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයට අදාළ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට අනුව 2020 විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් ඒකක 63 ක සීමාවන් සංශෝධනය කර ඇති බව දක්වා තිබූ අතර එම ආයතනවලින් 58 ක් පමණක් සීමාවන් වෙනස් කිරීමට අදාළ නිර්දේශ ලිපි විගණනයට ඉදිරිපත් කර තිබුණි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (40401) සීමාවන් වෙනස් කිරීමට අදාළ තොරතුරු කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නොවීය. | විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තාව කෙටුම්පත් අදියරේ පවතින අතර එම කෙටුම්පත් වාර්තාවේ වැය ශීර්ෂ 54ක් සඳහා අනුමැතීන් ලබා දී ඇති බව සඳහන් වේ. පසුව අනුමැතිය ලබා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ඇතුළුව වියදම් ඒකක 04ක් සඳහා සීමා සංශෝධනයන් සඳහා අනුමැතීන් ලබා දී තිබුණි. එහෙත් එය විගණනයට ඉදිරිපත් කර ඇති කෙටුම්පත් | විසර්ජන පනත මඟින් දක්වා ඇති සීමාවන්ට අනුකූලවීම හා ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කාර්ය සාධන වාර්තාවේ සඳහන් වී නොමැත. ඒ අනුව, 2020 වසර සඳහා වියදම් ඒකක 58ක් සඳහා සීමා සංශෝධනයන්ට අදාලව අනුමැතීන් ලබා දී ඇත. | |
| (ආ) | ආයතන 07 ක් සඳහා සීමාවන් සංශෝධනය කර ඇති බවට කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ සඳහන් වුවත් එම සංශෝධනයට අදාළ ලබාගත් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | එමගින් දන්වා ඇති ශීර්ෂයන් සඳහා සීමා සංශෝධනයන් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත. | විසර්ජන පනත මගින් දක්වා ඇති සීමාවන්ට අනුකූලවීම හා ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| (ඇ) | 2020 වර්ෂයට අදාළව 2020 අංක 06 දරණ විසර්ජන පනතේ තෙවන උපලේඛනය මගින් ප්‍රතිපාදන සලසා ඇති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වන සත්‍ය අගයන් හා අදාළ සීමා ඉක්මවීම හෝ ළඟානොවීම භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත ප්‍රකාශ සමඟ පරීක්ෂා කරන ලදී. එහිදී සීමා ළඟානොවීම් අවස්ථා 05 ක් හා අනුමත සීමාවන් ඉක්මවීම් අවස්ථා 06 ක් නිරීක්ෂණය වුවද, ඊට අදාළ සංශෝධනයන් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වියදම් ශීර්ෂ 11601, 30201, 28801, 33401, 26901 විසින් සීමා සංශෝධනයන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර නැත. ශීර්ෂ අංක 11501 ,41901, 42301, 21601, 41201, 41601, 42701, 02001 සඳහා ඉල්ලීම් කර තිබූ වියදම් සීමාවන් සඳහා පමණක් අනුමැතීන් ලබා දී ඇත. | -එම- |
| (ඈ) | එසේම 2020 අංක 06 දරණ විසර්ජන පනතේ තෙවන උපලේඛනය මගින් සලසා ඇති ගබඩා සහ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වන සත්‍ය අගයන් සහ භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ (23202) හා කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ (28502) උපරිම සීමාවන්ද ඉක්මවා තිබුණි. එහෙත් ඊට අදාළ සංශෝධන සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ශීර්ෂ අංක 23202 සඳහා සංශෝධනයන් අවශ්‍ය නොවන බව දුරකතනයෙන් දැනුම් දී ඇත. ශීර්ෂ අංක 25002, 25003, 22302, 30602, 31002, 31003 සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරමින් ලබා ගෙන ඇති අනුමැතීන්ට අදාලව යෝජනා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | -එම- |

(ඉ) ආයතන 04 කට අදාළ රජයේ නිලධාරීනගේ අත්තිකාරම් "බී" ගිණුම්වල අවසාන මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් සහ අවසාන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල දක්වා ඇති පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ශීර්ෂ අංකය | දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශය | සීමාව | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගය | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ප්‍රකාශවල දක්වා ඇති අගය | වෙනස |
|---|---|---|---|---|---|
| --------- | ----------------- | --------- | --------------- | ----------------- | ---------- |
| | | | රු. | රු. | රු. |
| 41201 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | අවම ලැබීම් සීමාව | 13,165,612.85 | 5,767,253 | 7,398,359.85 |
| 11501 | බලශක්ති අමාත්‍යාංශය | උපරිම වියදම් සීමාව | 2,484,748.66 | 12,886,577 | 10,401,828.34 |
| 33401 | බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය | හර ශේෂ සීමාව | 38,930,765.86 | 38,931,431.86 | 666 |
| 42701 | පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | අවම ලැබීම් සීමාව | 10,227,093.75 | 4,213,051 | 6,014,041.75 |

සටහන් කර ගතිමි.

-එම-

(ඊ) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ (ශීර්ෂ අංක - 288) උපරිම වියදම් සීමාව ඉක්මවා රු. 154,717 වියදම් දරා ඇති අතර එම සීමා ඉක්මවීමට අවශ්‍ය සංශෝධන අවශ්‍ය නොවන බව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනයට දන්වා තිබුණි.

නිවැරදියි.

-එම-

(උ) බලශක්ති අමාත්‍යාංශය (ශීර්ෂ අංක - 115) හා කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය (ශීර්ෂ අංක - 419) විසින් ඉල්ලුම් කර තිබූ අවම සීමා ලැබීම් සංශෝධනය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කර තිබුණද උපරිම වියදම් සීමා සංශෝධනය ඉල්ලුම් කර නොමැති බව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනයට දන්වා තිබුණි.

නිවැරදියි.

-එම-

(ඌ) බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය දෙපාර්තමේන්තුව (ශීර්ෂ අංක - 334) සහ දිස්ත්‍රික ලේකම් කාර්යාලය - මඩකලපුව (ශීර්ෂ අංක - 269) හර ශේෂ සීමා ඉක්මවීම දක්නට ලැබුණු අතර ඊට අදාළව සීමා සංශෝධන ඉල්ලීමක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනයට දන්වා තිබුණි.

නිවැරදියි.

-එම-

| | | | |
|---|---|---|---|
| (උ) | ආයතන 35 ක වසර ගණනාවක සිට පැවත එන රජයේ අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් නොවී පැවතුණු අතර ඒවායේ එකතුව රු. 1,361,561,464 ක ශුද්ධ වටිනාකමක් විය. ඉහත නිරවුල් නොවී පැවතුණු ශේෂයන් අතර ආයතන 09 ක රු. (20,479,126.88) වූ බැර ශේෂයන්ද ඇතුළත් වී තිබුණි. | මුදල් රෙගුලාසි මඟින් අවශ්‍ය මඟපෙන්වීම් ලබා දී ඇති අතර ඒ අනුව අදාල වැය ශීර්ෂ විසින් කටයුතු කල යුතු බව දන්වමි. | දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මඟපෙන්වීම් හා උපදෙස් ලබාදිය යුතුවීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------ | ----------- |
| (අ) | අයවැය දෙපාර්තමේන්තුවේ අංක 150 දරණ චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු. 2,824,733,981 ක් වූ වාහනවල කල්බදු කාලය සමාලෝචිත වර්ෂයෙන් අවසාන වී ඇතත් ඒවා අදාළ ආයතනවලට පවරා දීමට කටයුතු කර නොතිබුණි. | රජය විසින් මිලදීගෙන, වෙනත් ආයතන වෙත මෙතෙක් පවරා නොදුන් රු. 2,824,733,981 ක කල්බදු වාහන 2020 වර්ෂය පුරාම පැවති COVID 19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රජය ගත් යම් යම් ක්‍රියාමාර්ග හේතුවෙන් වර්ෂය තුළදී නිසි පරිදි පවරාදීමට නොහැකිවිය. | කල්බදු කාලය අවසන් වාහන විධිමත් පරිදි හා කඩිනමින් පවරාදීම සිදුකළ යුතුවීම. |
| (ආ) | අංක 2/2014 හා 2014 ජූලි 23 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව, ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5ක කාලයකට පසුව පුද්ගලික නමට පැවරෙන නමුත් මහා භාණ්ඩාගාරය විසින් රු. 16,792,961,055 ක් වටිනා යතුරුපැදිවල එම කාලය අවසන් වී තිබුණද ඒවා නිසිලෙස පවරා දීමට කටයුතු කර නොතිබුණි. | 2020 දක්වා ගෙවීම් අවසන් යතුරුපැදි පවරා දීම සඳහා ලේඛන සකස් කර තිබුණත් COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු ප්‍රමාද විය. | -එම- |

**4.** **කළමනාකරණය මානව සම්පත්**

**---------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 09 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් ලෙස පුරප්පාඩු 25 ක් පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පවතින තනතුරු සම්පූර්ණ කරන ලෙස වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත්, මෙතෙක් ඒ සඳහා නිලධාරීන් ලැබී නොමැත | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |